ලංකාවේ 2019 වසර තුළ සිදුව ඇති දිවි අහිමි කරගැනීම් සංඛ්‍යාව 3,135 ක් බව පොලිස් සංඛ්‍යාලේඛනයන් තුළ සඳහන් වෙයි. එනම්, 2019 වසරේ දිවි අහිමි කරගැනීම් සාමාන්‍යය ගත් විට එය දිනකට දිවි අහිමි කරගැනීම් 8.5 ක් වෙයි.

දිවි අහිමි කරගැනීම් පිළිබඳ මාධ්‍ය වාර්තාවන් ඔස්සේද වක්‍රාකාරයෙන් දිවි අහිමි කරගැනීම් සඳහා ප්‍රේරණයන් ලැබීමට, දිවි අහිමි කරගැනීම් වසංගතයක් ආකාරයෙන් පැතිර යෑමට හැකියාවක් ඇති බැවින්, දිවි අහිමි කරගැනීම් වාර්තා කිරීමේදී ඒ පිළිබඳව හඳුන්වා දී ඇති මාධ්‍ය ආචාර ධර්මයන් නිවැරදිව පිළිපැදීම අත්‍යාවශ්‍ය කරුණක් ලෙසින් දැක්විය හැක.

දිවි අහිමි කරගැනීම් පිළිබඳ පුවත් වාර්තාවන් සමග උපකාරක අංක සඳහන් කිරීම ඔස්සේ, දිවි අහිමි කරගැනීමට පෙළඹවීමක් ඇති අයෙකුගේ දිවි ගලවා ගැනීම සඳහා ඉඩක් ලැබෙන බැවින්, නිරතුරුවම උපකාරක අංක සඳහන් කිරීම භාවිතාවක් කරගන්නා ලෙසින් අපි මාධ්‍යවේදීන්ව දිරිමත් කරමු.

ලෝක මානසික සෞඛ්‍ය දිනය අදයි. මේ, වගකීම් සහගත, ආචාර ධාර්මික මාධ්‍යකරණයක නියැළීම සඳහා වන සිහිකැඳවීමයි.

**#MentalHealthDay #Media #2020octo #SriLanka #MediaEthicsSL #lka #TV #NewsPapers**